# <u>හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් වාර්තාව</u>
# <u>2020.09.07</u>

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීමේ ගරු සම සභාපතිවරුන් දෙපලගේ ප්‍රධානත්වයෙන් සහ ගරු මැති ඇමතිතුමන්ලාගේ සහභාගීත්වයෙන් 2020.09.07 වන දින පෙ.ව. 9.00ට හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ප්‍රධාන රැස්වීම් ශාලාවේ දී පවත්වන ලදි.

ප්‍රථමයෙන්ම, අභිනවයෙන් පත් වූ ගරු සම සභාපතිවරුන් දෙපල ඇතුළු පැමිණ සිටි සියළුම දේශපාලන නායකත්වය හා රාජ්‍ය නිලධාරීන් හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් වරයා විසින් පිළිගන්නා ලද අතර, කොවිඩ් 19 වසංගතයට සාර්ථකව මුහුණ දුන් රටක් ලෙස පවතින අභියෝග හමුවේ දිස්ත්‍රික්කයේ නිෂ්පාදන වර්ධනය කිරීම, නව නිපැයුම් හඳුනාගැනීම හා ඒ සඳහා වෙළඳපොල නිර්මාණය කර ගැනීම සිදුකළ යුතු බවත්, මේ වන විට හම්බන්තොට දිස්ත්‍රික්කයේ රතු ළූණු වගාව, බී ළූණු වගාව හා බඩ ඉරිඟු වගාව ව්‍යාප්තිය වැඩි කිරීම සඳහා පර්යේෂන සිදු කරමින් පවතින බවත්, ප්‍රකාශ කරන ලදි. තව ද, මහාමාර්ග, අධ්‍යාපන, සෞඛ්‍ය ආදී විවිධ ක්ෂේත්‍රයන් කෙරෙහි අවධානය යොමු කරමින් හම්බන්තොට දිස්ත්‍රික්කයේ දියුණුව සඳහා කටයුතු කිරීමට දේශපාලන අධිකාරිය සහ සියළුම රාජ්‍ය නිලධාරීන් සහයෝගීව කටයුතු කළ යුතු බව ද වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදි. අනතුරුව කොවිඩ් 19 වසංගතය හේතුවෙන් රජයට යම් සහනයක් වීමේ අරමුණින් සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල එකමුතුවෙන් නිලධාරීන්ගේ එක් දින වැටුපක් කොවිඩ් 19 අරමුදලට ප්‍රධානය කිරීම සිදුකර අතර එය ගරු වාරි මාර්ග අමාත්‍ය චමල් රාජපක්ෂ මැතිතුමන් වෙත පිරිනමන ලදි.

කමිටුවේ ගරු සම සභාපති හා හම්බන්තොට දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී වෛද්‍ය උපුල් සංජීව ගලප්පත්ති මැතිතුමන් විසින් සභාවේ කටයුතු ආරම්භ කරමින් සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව දේශීය ආර්ථිකයක් නිර්මාණය කිරීම සඳහා වරාය, ගුවන්තොටුපල සංවර්ධනය ආදිය හරහා දිස්ත්‍රික්කයේ ආර්ථිකය නගා සිටුවීම උදෙසා සියළු දෙනා සහයෝගීව කටයුතු කිරීමේ අවශ්‍යතාවය පෙන්වා දෙන ලදි.

අනතුරුව ගරු සම සභාපති හා දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර ආචාර්ය විලියම් විජේසිංහ ගමගේ මැතිතුමන් විසින් සභාව අමතමින් කොවිඩ් 19 වසංගතය හමුවේ සියළු දෙනා සහයෝගීව කටයුතු කළ බවත්, දකුණු පළාතේ ඩෙංගු වසංගතය ඉහල මට්ටමින් පාලනය කර ඇති බවත් ඒ සඳහා සෞඛ්‍ය හා ආරක්ෂක අංශ විසින් උපරිම සහයෝගය ලබා දුන් බවත්, පවතින යටිතල පහසුකම් උපරිම ප්‍රයෝජනයට ගනිමින් ඉදිරි සංවර්ධන කටයුතු සිදුකළ යුතු බවටත් ප්‍රකාශ කරමින් විශේෂයෙන්ම පළමු වසරට ළමුන් ඇතුළත් කිරීමේ දී ඇතිවන තදබදය අවම කිරීම සඳහා නව සංකල්ප ඇතුළත් ක්‍රමවත් වැඩපිළිවෙලක් සකස් කිරීමට බලාපොරොත්තු වන බවත්, ඒ යටතේ පාසල් 50ක් සංවර්ධනය කොට වසරකට පළමු වසර ළමුන් 3000ක් ඇතුළත් කර ගැනීමට හැකිවන පරිදි කටයුතු සම්පාදනය කිරීමට අපේක්ෂිත බවත් ප්‍රකාශ කරන ලදි.

2020.02.03 වන දිනැති රැස්වීම් වාර්තාවේ අඩුපාඩු කිසිවක් නොවූ බැවින් එම වාර්තාව සභා සම්මත කරන ලද අතර, අනතුරුව සාකච්ඡා කරන ලද කරුණු හා ගනු ලැබූ තීරණ පහත පරිදි වේ.

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| **01** | **සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය ඉදිරිපත් කිරීම** | | | |
| 1.1 | සපිරිගමක් - ජනතා සහභාගීත්ව ග්‍රාමීය සංවර්ධන වැඩසටහන - 2020 | ග්‍රාමීය සංවර්ධන කටයුතු උදෙසා මෙම වැඩසටහන ක්‍රියාත්මක වන බවත්, සෑම ග්‍රාම නිලධාරී වසමකටම රු.මි. 2 බැගින් රු.මි. 1152ක් අනුමත වී ඇති බවත්, ඒ යටතේ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති 1022 ක්‍රියාත්මක වන බව පවසන ලද අතර ඒ සම්බන්ධ ප්‍රගතිය ඉදිරිපත් කරන ලදි. පැවති කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් පසුගිය මාස කිහිපය තුල යම් | ඉදිරි කටයුතු කඩිනම් කර සියළුම ව්‍යාපෘති මෙම වර්ෂය තුළ නිම කිරීමට කටයුතු කරන ලෙස දන්වන ලදි. | අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) / සියළුම ප්‍රාදේශීය ලේකම්වරු |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | පසුබෑමක් ඇති වුවද මේ වන විට සාමාන්‍ය පරිදි කටයුතු සිදු වෙමින් පවතින බව ද ප්‍රකාශ කරන ලදි. | | |
| 1.2 | ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන - 2020 | ව්‍යාපෘති 87ක් සඳහා රු.මි. 80ක් අනුමත වී ඇති බවත්, මේ වන විට ව්‍යාපෘති 28ක වැඩ අවසන් කර ඇති බවත් පැවති වසංගත තත්වය හේතුවෙන් ක්‍රියාකාරීත්වයේ යම් පසු බෑමක් ඇති වුව ද මේ වන විට සාමාන්‍ය පරිදි කටයුතු සිදු වෙමින් පවතින බවත් ප්‍රකාශ කරන ලදි. | ඉදිරි කටයුතු කඩිනමින් සිදු කිරීමට තීරණය විය. | අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) / සියළුම ප්‍රාදේශීය ලේකම්වරු |
| 1.3 | හම්බන්තොට දිස්ත්‍රික්කයේ පවුල් හා පුද්ගලයන් පිළිබඳ දත්ත පද්ධතියක් සකස් කිරීම | කොවිඩ් වසංගත අවස්ථාවේ පුද්ගලයන්ගේ තොරතුරු ලබා ගැනීමේ දී මුහුණ දුන් අපහසුතාවයන් සැලකිල්ලට ගනිමින් දිස්ත්‍රික්කයේ සියළුම පවුල් හා පුද්ගලයන්ගේ තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් සකස් කිරීම දිස්ත්‍රික් ලේකම් තුමාගේ මගපෙන්වීම පරිදි ආරම්භ කරන ලද බවත්, එය ග්‍රාම නිලධාරී වසම් මට්ටමින්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් හා දිස්ත්‍රික් මට්ටමින් තොරතුරු වෙන් කර හඳුනාගත හැකි වන පරිදි සකස් කර ඇති බවත්, නිවාස සම්බන්ධ තොරතුරු, දුරකථන භාවිතය, වාහන, රැකියාව, අධ්‍යාපන මට්ටම, පුද්ගලයන්ගේ ආදායම ආදී සියළුම තොරතුරු මෙම පද්ධතියට ඇතුලත් කිරීමට කටයුතු කරන බවත්, මෙම දත්ත පද්ධතිය සංවර්ධන කටයුතු ඇතුළු සියළුම කාර්යන් සඳහා අවශ්‍ය දත්ත පහසුවෙන් ලබා ගත හැකි පරිදි සකස් කර ඇති බවත් ප්‍රකාශ කරන ලදි. 2020 පාර්ලිමේන්තු මැතිවරණය හේතුවෙන් තාවකාලිකව කටයුතු නතර වුවද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් රැස්කරන ලද තොරතුරු මේ වන විට පරිගණක ගත කරමින් පවතින බවත්, 2020 සැප්තැම්බර් මාසය අවසන් වන විට දත්ත පද්ධතිය සම්පූර්ණයෙන් ම නිම කිරීමට ඉලක්ක කර ඇති බවත් ප්‍රකාශ කරන ලදි.<br>මෙම තොරතුරු පද්ධතියේ වැඩ නිමවීමෙන් පසුව තොරතුරු අවශ්‍ය ආකාරයට වෙන් කර ගැනීමේ හැකියාව (data Filter) පවතින බව ද ප්‍රකාශ කරන ලදි. | දිස්ත්‍රික්කයේ මෙවැනි තොරතුරු පද්ධතියක් පවත්වාගෙන යාම සියළුම කටයුතු සඳහා ඉතා ප්‍රයෝජනවත් වන බැවින් එම කටයුතු කඩිනමින් නිම කිරීමට තීරණය විය. | අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) / සියළුම ප්‍රාදේශීය ලේකම්වරු |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| **02** | අධ්‍යාපන ක්ෂේත්‍රයේ ගැටළු | | | |
| 2.1 | තිස්සමහාරාම මාගම විද්‍යාලයේ පන්ති කාමර සහිත ගොඩනැගිල්ලේ දෙවන මහල ඉදිකිරීම | පළමුමහලේ වැඩ අවසන් කර ඇති බවත්, දෙවන මහල සඳහා යොදා ඇති ස්ලැබ් එකෙහි කම්බි කූරු නිසි ප්‍රමිතියෙන් තොර බැවින් ඉදිරි ඉදිකිරීම් කටයුතු නතර වී ඇති බවටත්, දෙවන මහල ඉදිකිරීම සඳහා පවතින ස්ලැබ් එක ඉවත් කළ යුතු බවටත් කරුණු ඉදිරිපත් විය.<br>රාජ්‍ය නොවන ආයතනයක් මඟින් මෙහි කටයුතු සිදුකර ඇති අතර, ස්ලැබ් එක යොදා දීර්ඝ කාලයක් ගතවීම නිසා කම්බි මල අල්ලා ඇති බැවින් ඉදිරි කටයුතු කිරීමේ අපහසුතාවයක් ඇති බවට කරුණු ඉදිරිපත් විය. | ඒ සම්බන්ධයෙන් සියළු තොරතුරු ඇතුළත් වාර්තාවක් සති දෙකක් ඇතුළත ලබා දීමට තීරණය විය. | දිස්ත්‍රික් ඉංජිනේරු (ගොඩනැගිලි) / කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ - හම්බන්තොට |
| 2.2 | අරන්වෙල මහා විද්‍යාලයේ අබලන්ව පවතින ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම | උසස් පෙළ පන්තිය ආරම්භ කිරීම සඳහා ඉඩකඩ ගැටළුවක් පවතින බැවින් දැනට අතහැර දමා ඇති අබලන්ව පවතින ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය සඳහා දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයට දැනුම් දී ප්‍රතිපාදන ඉල්ලා ඇති බවට තොරතුරු ඉදිරිපත් විය.<br>ගොඩනැගිලි ඉදිකිරීම හා ප්‍රතිසංස්කරණය සඳහා පවතින සීමිත ප්‍රතිපාදන ප්‍රමුඛතා අනුපිළිවෙලට වෙන් කරන බවට කරුණු ඉදිරිපත් විය. | අවශ්‍ය ප්‍රතිපාදන ලබා ගෙන කඩිනමින් එම ප්‍රතිසංස්කරණ කටයුතු නිම කර පන්තිය ආරම්භ කිරීමට තීරණය විය | දකුණු පළාත් අධ්‍යාපන ලේකම් / දකුණු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ / කළාප අධ්‍යාපන අධ්‍යක්ෂ - තංගල්ල |
| 2.3 | බෙරලිහෙල 3 කොළණිය පාසලේ ගොඩනැගිලි ගැටළු | මෙම පාසල් සඳහා ගොඩනැගිලි අවශ්‍යතාවයක් පවතින බවට කරුණු ඉදිරිපත් විය. | අවශ්‍ය ප්‍රතිපාදන පළාත් සභාවෙන් ඉල්ලීම් කිරීමට තීරණය විය. පාසල් බොහෝමයක අඩුපාඩු සහ ගැටළු පවතින බැවින් කළාප අධ්‍යාපන අධ්‍යක්ෂකවරු සමඟ සම්බන්ධීකරණය වී දිස්ත්‍රික්කයේ සංවර්ධනය විය යුතු පාසල් ගොඩනැගිලි ප්‍රමුඛතා අනුපිළිවෙලට ලයිස්තුවක් සකස් කිරීමට තීරණය විය. | ලේකම් - දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය / කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ - තංගල්ල,වලස්මුල්ල, හම්බන්තොට |
| 2.4 | බෙලිඅත්ත මධ්‍ය මහා විද්‍යාලයේ ගොඩනැගිල්ල ඉදිකිරීමේ ගැටළු | | | |
| 2.5 | වීරකැටිය ප්‍රාථමික විද්‍යාලයට සිසුන් ඇතුළත් කර ගැනීමේ දී මතු වී ඇති ගැටළු | කැප්පෙටියාව, තිරාවල යන ප්‍රදේශවල ළමුන් ප්‍රාථමික විද්‍යාලයට ඇතුලත් කර ගැනීම හේතුවෙන් වීරකැටිය මධ්‍ය මහා විද්‍යාලයට ශිෂ්‍යත්වධාරීන් ඇතුළත් කර ගැනීම සඳහා අවස්ථාව නොමැති වන බවට තොරතුරු ඉදිරිපත් විය.<br>ළමුන් ඇතුළත් කර ගැනීමේ ප්‍රතිපත්ති හා ගුරු ප්‍රශ්නයට ප්‍රතිපත්තිමය විසඳුමක් ලබා ගත යුතු බැවින් හා ජාතික මට්ටමින් ඉදිරිපත් කර ඇති චක්‍රලේඛ | ජාතික මට්ටමින් සාකච්ඡා කොට පළාත් සභා මට්ටමින් චක්‍රලේඛයක් සකස් කිරීම සුදුසු බවටත් අවට පාසල් සංවර්ධනය කිරීම සුදුසු බවටත් තීරණය විය. | ලේකම් - දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය / දකුණු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ / අධ්‍යාපන අධ්‍යක්ෂ - තංගල්ල,වලස්මුල්ල, |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | අනුව කටයුතු කිරීමේ දී ඇතැම්විට යම් යම් අඩුපාඩු සිදුවන බැවින් පවතින චක්‍රලේඛය පළත් සභාවට ගැලපෙන පරිදි සකස් කිරීම සුදුසු බවට යෝජනා ඉදිරිපත් විය.<br>ජාතික පාසල් මට්ටමට අනෙකුත් පාසල් සංවර්ධනය කිරීමට කටයුතු සිදු කරමින් පවතින බැවින් ගැටළු යම් තරමකට විසඳා ගත හැකි බව ප්‍රකාශ කරන ලදි. | | හම්බන්තොට |
| 2.6 | දිස්ත්‍රික්කයේ පවතින ගුරු හිඟය හේතුවෙන් මතු වී ඇති ගැටළු | දිස්ත්‍රික්කයේ බොහෝ පාසල්වල ඉංග්‍රීසි, සංගීතය, නැටුම් වැනි විෂයයන් සඳහා ගුරු හිඟයක් පවතින බවටත්, එම හේතුවෙන් ඇතැම් පාසල් සඳහා ළමුන් ඇතුලත් කිරීමට දෙමාපියන් පසුබට වන බවටත්, ලුණුගම්වෙහෙර ප්‍රදේශයේ පාසල් සඳහා ගුරුවරු 45ක හිඟයක් පවතින බවටත් කරුණු ඉදිරිපත් විය.<br>ගුරුවරුන් තුලනයේ ගැටළුවක් මිස දිස්ත්‍රික්කයේ ගුරු හිඟයක් නොමැති බවත්, එසේ වුව ද, ඉදිරියේ දී ගුරුවරුන් 250ක් බඳවා ගැනීමට නියමිත බැවින් මෙම ගැටළුවලට විසඳුම් ලබා දිය හැකි බවත්, දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර විසින් දන්වන ලදි.<br>ගුරුවරුන් ස්ථානගත කිරීමේ දී ඔවුන්ගේ පදිංචිය පිළිබඳව සලකා බැලීම අත්‍යාවශ්‍ය වන බවටත්, ගුරු මාරුවීම් සඳහා දේශපාලන අධිකාරිය මැදිහත් වීම නතර කිරීමට සහ හදිසි මාරුවීමක දී සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබා ගත යුතු බවට කමිටු තීරණයක් ගැනීම සුදුසු බවටත්, මධ්‍යම රජයේ අරමුදල් සහිතව එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකට එක් බහු කාර්ය පාසලක් සංවර්ධනය කිරීම සුදුසු බවටත් යෝජනා ඉදිරිපත් විය. | විෂය ධාරාවන්ට අදාලව ගුරුවරුන් හිඟ පාසල් සහ ගරු අතිරික්තය සහිත පාසල් පිළිබඳ ලේඛනයක් සති දෙකක් ඇතුළත ලබා දෙන ලෙස උපදෙස් ලබා දුනි.<br>පාසල් සම්බන්ධයෙන් බොහෝ ගැටළු පවතින බැවින් සියළු ගැටළු සාකච්ඡා කිරීම සඳහා වෙනම රැස්වීමක් පැවැත්වීමට තීරණය කරන ලදි. | ලේකම් - දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය / කළාප අධ්‍යාපන අධ්‍යක්ෂකවරු |
| **03** | **වාරිමාර්ග ක්ෂේත්‍රයේ ගැටළු** | | | |
| 3.1 | වාරි මාර්ග රක්ෂිත සීමාවේ ඇති ඉඩම් සංවර්ධනය කිරීමේ දී වාරිමාර්ග දෙපාර්තමේන්තු වේ අවසර ලබා ගැනීම | වාරි මාර්ග රක්ෂිත ආසන්නයේ පිහිටා ඇති ඉඩම්වල වාරිමාර්ග කාර්යාලයේ විමසීමකින් තොරව විවිධ ඉදිකිරීම් සඳහා ඇතැම් ආයතන විසින් අවසර දීම හේතුවෙන් පුද්ගලයින් රක්ෂිත ආක්‍රමණය කිරීමත්, ජල මූලාශ්‍ර අනවසරයෙන් පරිහරණය කිරීමත් නිසා ගැටළු මතු වී ඇති බවට කරුණු ඉදිරිපත් විය. | විවිධ ආයතනවලට අදාල රක්ෂිත හඳුනාගෙන ඒවා ආරක්ෂා කර ගැනීමට කටයුතු කිරීම සෑම ආයතනයක් විසින් ම කළ යුතු බවටත්, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී හෝ මුදල් ලබා ගැනීමේ දී ඒ පිළිබඳව රක්ෂිත අයත් | වාරිමාර්ග අධ්‍යක්ෂ - හම්බන්තොට / සියළුම ආයතන ප්‍රධානීන් |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | | ආයතන සමඟ සාකච්ඡා කර කටයුතු කිරීම සුදුසු බවටත් තීරණය කරන ලදී. | |
| 3.2 | ගොඩ ගොවීන්ගේ ඉඩම්වලට වාරිමාර්ග ජලය ලබා ගැනීමේ දී සිදුවන ගැටළු | ගොඩ ගොවිතැන් සඳහා ජලය පොම්ප කර ලබා ගැනීමේ දී පවතින වාර්මාර්ග නීති රීති හේතුවෙන් ගොවීන් අපහසුතාවයට පත් වී ඇති බව ප්‍රකාශ කරන ලදි. | ව්‍යාපාර කමිටුවේ දී මේ පිළිබඳව සාකච්ඡා කොට සුදුසු තීරණ ගන්නා ලෙස උපදෙස් ලබා දුනි. වාරිමාර්ග ආඥා පනත සංශෝධනය කිරීමට නියමිත බැවින් උස්සාන වාරි යෝජනා ක්‍රම සඳහා ජලය ලබා දීමේ දී ඒ පිළිබඳව සැලකිලිමත් වන ලෙස උපදෙස් ලබා දුනි. | වාරිමාර්ග අධ්‍යක්ෂ - හම්බන්තොට |
| 3.3 | ඕලුවිල වැව් බස්නාව අවහිර වීම නිසා සිදුවන අපහසුතාවය මගහරවා ගැනීම | වැව් බස්නාව සුද්ද කිරීම යන්ත්‍ර සූත්‍ර යොදා සිදුකරන අතර බස්නාවේ මීටර 200ක පමණ ප්‍රමාණය පෞද්ගලික ඉඩමක් හරහා වැටී ඇති බැවින් එම කොටස පවිත්‍ර කිරීම සඳහා ඉඩම් හිමියන්ගෙන් බාධා එල්ල වී ඇති බවටත්, එම හේතුවෙන් තංගල්ල තිස්ස මාර්ගයේ කුඩාවිල බෝක්කුව අසල මාර්ගය ජලයෙන් යට වීම, ලන්සිවත්ත ප්‍රදේශය යටවීම වැනි ගැටළු මතු වී ඇති බවටත් කරුණු ඉදිරිපත් විය. | ඉඩම් හිමියන් විසින් අවසර නොදෙන්නේ නම් අත්පත් කර ගැනීමට කඩිනමින් කටයුතු කරන ලෙස උපදෙස් ලබා දුනි. | ප්‍රාදේශීය ලේකම් - අම්බලන්තොට / වාරිමාර්ග අධ්‍යක්ෂ - හම්බන්තොට |
| 3.4 | කඩවර වැව සංවර්ධනය කිරීම | වැව සංවර්ධනය කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව කරුණු ඉදිරිපත් විය. | ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදුකරන ලෙස දන්වන ලදී. | ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් - හම්බන්තොට |
| **04** | **මාර්ග සංවර්ධන හා මගී ප්‍රවාහන ක්ෂේත්‍රයේ ගැටළු** | | | |
| 4.1 | අඟුණකොළපැලැස්ස බස් නැවතුම්පල ඉදිකිරීම සඳහා කමිටුවේ අනුමැතිය ලබා ගැනීම | රන්න, හුංගම, අඟුණකොළපැලැස්ස, මිද්දෙනිය හා වීරකැටිය යන ප්‍රධාන නගර යටතේ ක්‍රියාත්මක වන බස් සේවා සියල්ල අඟුණකොළපැලැස්ස නගරය හරහා ගමන් කරන අතර පහසුකම් සහිත බස් නැවතුම්පලක් නොමැති වීම හේතුවෙන් මඟීන් අපහසුතාවයට පත් වී ඇති බවටත්, නාගරික සංවර්ධන අධිකාරියේ සැලැස්ම අනුව උසාවිය අසලින් ඉඩමක් වෙන් කර ඇති අතර මහවැලි අධිකාරිය විසින් වෙනත් ස්ථානයක් නම් කර ඇති බවටත් කරුණු ඉදිරිපත් විය. | අඟුණකොළපැලැස්ස නගර සංවර්ධන සැලැස්ම අනුව කටයුතු කිරීම සුදුසු වන බැවින් ප්‍රාදේශීය සභාව, මහවැලි අධිකාරිය, නාගරික සංවර්ධන අධිකාරිය සාකච්ඡා කර පවතින ගැටළු විසඳාගන්නා ලෙස උපදෙස් ලබා දුනි. | ගරු සභාපති - අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාව / සහකාර අධ්‍යක්ෂ - දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය / නොවාසික ව්‍යාපාර කළමනාකරු - ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 4.2 | අම්බලන්තොට පැරණි බස්නැවතුම්පල ඉවත් කර නවීන බස්නැවතුම්පලක් ඉදිකිරීම | විශාල බස් සේවාවන් ප්‍රමාණයක් අම්බලන්තොට නගරය හරහා ක්‍රියාත්මක වන අතර, බස්නැවතුම්පල අංගනය හා වැසිකිළි පද්ධතිය මේ වන විට සකසා ඇතත්, බස්නැවතුම් පල නවීකරණය වී නොමැති බැවින් අපහසුතාවයන් රාශියක් පවතින බවට කරුණු ඉදිරිපත් විය.<br>වැසිකිළි පද්ධතිය සංවර්ධනය කර ඇතත්, එය නිසි පරිදි නඩත්තු කිරීම් කටයුතු සිදු නොවන බවට කරුනු ඉදිරිපත් විය. | ඉදිරි සංවර්ධන ව්‍යාපෘතිවලදී මේ පිළිබඳව සලකා බලා කටයුතු කරන ලෙස දන්වන ලදි.<br>වැසිකිළි පද්ධතිය ප්‍රාදේශීය සභාවට පවරා දීම සුදුසු බවට තීරණය විය. | සභාපති - අම්බලන්තොට ප්‍රාදේශීය සභාව / සහකාර අධ්‍යක්ෂ - දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය |
| 4.3 | ලුණුගම්වෙහෙර බස්නැවතුම්පොල සක්‍රීය කිරීම සඳහා ලුණුගම්වෙහෙර නගර සංවර්ධන සැළැස්ම ක්‍රියාත්මක කිරීම. | බස්නැවතුම්පල මේ වන විට ඉදිකොට අවසන් කර ඇති නමුත්, එය මූලික මාර්ග පද්ධතියට පරිභාහිරව පිහිටා ඇති බැවින් ප්‍රවාහන කටයුතු සඳහා අපහසුතාවයන් පවතින බවටත්, සක්‍රීය බස්නැවතුම්පලක් ලෙස එය සංවර්ධනය කිරීම අවශ්‍ය බවටත් කරුණු ඉදිරිපත් විය.<br>වෙනත් ඉදිකිරීම් නිසා ලුණුගම්වෙහෙර නගර සංවර්ධන සැළැස්ම ක්‍රියාත්මක නොවීමෙන් මෙම ගැටළු පැන නැගී ඇති බැවින් නාගරික සංවර්ධන අධිකාරිය මඟින් සකස් කර ඇති සැළැස්ම සුදුසු පරිදි නැවත සැලසුම් කර ගැටළු විසඳාගත යුතු බවට කරුණු ඉදිරිපත් විය. | ලුණුගම්වෙහෙර නගර සැළැස්ම සකස් කර කඩිනමින් සාකච්ඡාවට ගැනීමට තීරණය විය. | ගරු සභාපති - ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාව ප්‍රාදේශීය ලේකම් - ලුණුගම්වෙහෙර / නොවාසික ව්‍යාපාර කළමනාකරු - ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය / නියෝජ්‍ය අධ්‍යක්ෂ- නාගරික සංවර්ධන අධිකාරිය |
| 4.4 | සංවර්ධන කටයුතු සඳහා ඉඩම් ලබා ගැනීමේ දී මතු වී ඇති ගැටළු | රජයේ ඉඩම් නින්දගම් ඉඩම් ලෙස හඳුන්වමින් ප්‍රකාශිත ඔප්පු නිකුත් කිරීම නිසා සංවර්ධන කටයුතු සඳහා ඉඩම් පවරා ගැනීමේ දී ගැටළු මතු වී ඇති බවට කරුණු ඉදිරිපත් විය.<br>නින්දගම් අහෝසි වී ඇති බැවින් එවැනි ඔප්පු තිබිය නොහැකි බවට කරුණු ඉදිරිපත් විය.<br>ආර්ථික කලාප හා අලිමංකඩ ගැසට් කරමින් එම ඉඩම් ආරක්ෂා කර ගැනීමට පියවර ගැනීම සුදුසු බවටත්, නිවාස ඉදිකිරීම් විධිමත් සැලසුමක් අනුව කළ යුතු බවටත් කරුණු ඉදිරිපත් විය. | සංවර්ධන කටයුතුවලට අදාල ඉඩම්, අලිමංකඩ හා වන අලි කළමනාකරණ රක්ෂිත වෙන්කර ගැසට් කිරීම සුදුසු බවට ද, මේ සම්බන්ධයෙන් තීරණ ගැනීම සඳහා අදාල සියළු පාර්ශව සමඟ වෙනම රැස්වීමක් පැවැත්වීමට ද තීරණය විය. | ප්‍රාදේශීය ලේකම් - තිස්සමහාරාමය, ලුණුගම්වෙහෙර, හම්බන්තොට / සහකාර අධ්‍යක්ෂ (වනජීවී) / දිසාවන නිලධාරී |
| 4.5 | අම්බලන්තොට පුහුල්යාය ග්‍රාමීය පාලම ඉදි නොකිරීම | වසර කිහිපයක සිට වලවෙවත්ත, මාමඩල, පළුගහගොඩැල්ල හා බොරලැස්ස යනාදී ගම්මානවල ජනතාව මෙම පාලම ඉදි නොකිරීම හේතුවෙන් අපහසුතාවයට පත් වී ඇති බවට කරුණු ඉදිරිපත් විය. | සකස් කර ඇති ඇස්තමේන්තුව අනුව ඉදිරි කටයුතු කිරීම සුදුසු බවට තීරණය කරන ලදි. | දිස්ත්‍රික් ඉංජිනේරු - දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 4.6 | අගලබඩ වෙළඳගොඩ වැව් බැම්ම අසල මාර්ගය වසා දැමීම | මෙම මාර්ගය වසා දැමීම හේතුවෙන් ප්‍රදේශයේ ජනතාව ප්‍රවාහන කටයුතුවලදී අපහසුතාවයට පත් වී ඇති බවට කරුණු ඉදිරිපත් විය.<br>අනවසර වැලි ප්‍රවාහනය නිසා මෙම මාර්ගය වසා දමා ඇති බවත්, පාසල් ළමුන්ට හා වෙනත් විශේෂ කරුණු සම්බන්ධයෙන් පමණක් මාර්ගය භාවිතා කිරීමට අවසර ලබා දී ඇති බවත් ප්‍රකාශ කරන ලදි. | ට්‍රැක්ටර්, ත්‍රී වීලර් වැනි කුඩා වාහන සඳහා සීමාකර මාර්ගය දිවා කාලයේ දී පමණක් විවෘත කිරීම සුදුසු බවට තීරණය කරන ලදි. | අධ්‍යක්ෂ - වාරිමාර්ග |
| **05** | **ඉඩම් ක්ෂේත්‍රයේ ගැටළු** | | | |
| 5.1 | හම්බන්තොට මහනගර සීමාවේ දීර්ඝකාලීන පදිංචිකරුවන් සඳහා ඉඩම් ඔප්පු ලබා නොදීම නිසා ඉදිකිරීම් සඳහා අනුමැතිය ලබා ගැනීමට නොහැකි වීම | මෙම පදිංචිකරුවන් විසින් යම් ඉදිකිරීමක් සිදු කිරීමේ දී අදාල පළාත් පාලන ආයතනයේ අනුමැතිය ලබා ගත යුතු බැවින් එහිදී පදිංචිය සනාථ කිරීම සඳහා නීත්‍යානුකූල ලියවිල්ලක් නොමැති වීම නිසා අපහසුතාවයට පත් වී ඇති බවට තොරතුරු ඉදිරිපත් විය.<br>නිවාස සංවර්ධන අධිකාරිය මඟින් නිවාස ලබා දීමේ දී ඉඩම් කච්චේරි මඟින් ලබා දෙන ලේඛනයෙන් පරිභාහිරව නිවාස ලබා දී ඇති බැවින් එම පදිංචිකරුවන් සඳහා ඔප්පු ලබා දීමේදී ගැටළු පවතින බවට කරුණු ඉදිරිපත් විය.<br>දීර්ඝ කාලයක් තිස්සේ පදිංචි වී සිටිය ද මෑත කාලයේදී බදුකර සඳහා තක්සේරු කිරීමෙන් වැඩි මුදලක් ගෙවීමට සිදුවීම නිසා අඩුආදායම්ලාභීන් අපහසුතාවයට පත් වී ඇති බවට කරුණු ඉදිරිපත් විය. | මේ පිළිබඳ සියළුම විස්තර ඇතුලත් වාර්තාවක් ලබා දෙන ලෙස උපදෙස් ලබා දෙන ලදි. | දිස්ත්‍රික් කළමනාකරු - නිවාස සංවර්ධන අධිකාරිය / හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් / නාගරික කොමසාරිස් - හම්බන්තොට / නියෝජ්‍ය අධ්‍යක්ෂ - නාගරික සංවර්ධන අධිකාරිය |
| 5.2 | සුනාමි නිවාස සඳහා ඔප්පු ලබා දීම ප්‍රමාද වීම | තංගල්ල යායවත්ත හා හම්බන්තොට සුනාමි නිවාස ව්‍යාපෘතිවල පදිංචිකරුවන් සඳහා මේ වන තෙක් දීමනාපත්‍ර ලබා දී නොමැති බැවින් එම පිරිස් අපහසුතාවයන්ට පත් වී ඇති බවට කරුණු ඉදිරිපත් වූ අතර මේ සම්බන්ධයෙන් ඉඩම් කොමසාරිස් ජනරාල් සමඟ සාකච්ඡාවක් කිරීමට ඉල්ලීම් ඉදිරිපත් විය.<br>නියම වින්දිතයන් නොවන අයට ද ඉඩම් ලබා දී ඇති බැවින් දීමනාපත්‍ර ලබා දීමේ නීතිමය ගැටළු පවතින බවට කරුණු ඉදිරිපත් විය.<br>එවැනි ගම්මානවල මුල් පදිංචිකරුවන් විවිධ හේතු නිසා මේ වන විට පදිංචිව නොසිටින අතර වෙනත් පුද්ගලයින් ඒවායේ පදිංචි වී සිටින බවත්, ඒ අය සඳහා අයිතිය ලබා නොදීම නිසා ළමුන් පාසල්වලට ඇතුළත් කිරීම ඇතුළු බොහෝ කටයුතුවලදී අපහසුතාවයන්ට | පදිංචිය පිළිබඳව ගැටළු නොමැති පිරිස් සඳහා කඩිනමින් ඔප්පු ලබා දීමට ද සෑම ගම්මානයකම පදිංචිය සම්බන්ධ මෙවැනි ගැටළු පවතින පවුල් පිළිබඳ විස්තරාත්මක වාර්තාවක් ලබා දීමට ද තීරණය විය. | නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් - දකුණු පලාත් සභාව / ප්‍රාදේශීය ලේකම් - හම්බන්තොට / තංගල්ල, ලුණුගම්වෙහෙර, තිස්සමහාරාමය, අම්බලන්තොට |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | මුහුණපෑමට සිදු වී ඇති බැවින් එම ගැටළු කඩිනමින් විසඳිය යුතු බවට ද කරුණු ඉදිරිපත් විය. | | |
| 5.3 | පන්නෙගමුව ආර්ථික මධ්‍යස්ථානයට ඉඩම් පවරා ගැනීමේ දී මතු වී ඇති ගැටළු | ඉඩම් පවරා ගැනීමේ දී හා ඔප්පු හෝ දීමනාපත්‍ර ලබා දීමේ දී ඇතිවන ගැටළු කඩිනමින් විසඳීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට ඉඩම් සම්බන්ධ වෙනම මාණ්ඩලික නිලධාරියෙකු පත් කිරීම සුදුසු බවට කරුණු ඉදිරිපත් විය. | දිස්ත්‍රික්කයේ ඇති මෙවැනි ගැටළු කඩිනමින් විසඳා ගත යුතු අතර ඒ සඳහා දිස්ත්‍රික් ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් යුතු වෙනම කමිටුවක් පත් කර අවශ්‍ය කටයුතු කිරීම සුදුසු බවට තීරනය කරන ලදි. | අතිරේක දිස්ත්‍රික් ලේකම් - හම්බන්තොට |
| **06** | **වනජීවී හා වන සංරක්ෂණ ක්ෂේත්‍රයේ ගැටළු** | | | |
| 6.1 | වීරවිල වාරි රක්ෂිතය වනජීවී දෙපාර්තමේන්තු වෙන් නිදහස් කර ගැනීම | වනජීවී රක්ෂිත ප්‍රදේශවල වගාබිම් ඇති බැවින් වගා කටයුතු වලදී ට්‍රැක්ටර් හා බැකෝ යන්ත්‍ර භාවිතා කිරීමේ දී වනජීවී කාර්යාල මඟින් ඒවා අත්අඩංගුවට ගැනීම නිසා ගොවීන් අපහසුතාවයට පත් වී ඇති බවට කරුණු ඉදිරිපත් විය.<br>එකී භූමිය නිදහස් කිරීම පාර්ලිමේන්තු අනුමැතියකින් තොරව කළ නොහැකි බවට ද පාරම්පරික ගොවීන්ට බාධා නොකරන අතර ගොවිතැන් මුවාවෙන් වෙනත් නීති විරෝධී කටයුතු සිදු කරන අයට පමණක් නීතිමය පියවර ගැනීමට කටයුතු කර ඇති බවට ද කරුණු ඉදිරිපත් විය. | මෙවැනි ගැටළු සම්බන්ධයෙන් වාර්තාවක් සහ ජනතාවට අවහිරයක් නොවන ලෙස අවශ්‍ය බිම් නිදහස් කිරීම සඳහා සකස් කර ඇති සැලසුම සිතියම ද සහිතව ඉදිරිපත් කරන ලෙස උපදෙස් ලබා දුනි.<br>ගැටළුව විසඳා ගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම්, වාරිමාර්ග, වනජීවී, වන සංරක්ෂණ ආදී සියළුම පාර්ශව එකමුතුව ජනතාවට සහන සලසන ආකාරයේ ක්‍රියාමාර්ග ගන්නා ලෙසත් ඒ පිළිබඳව දැනුවත් කරන ලෙසත් දන්වන ලදි. | ප්‍රාදේශීය ලේකම් - තිස්සමහාරාමය / සහකාර අධ්‍යක්ෂ (වනජීවී) / දිසා වන නිලධාරී / දිස්ත්‍රික් මිනින්දෝරු අධිකාරී |
| 6.2 | වන සතුන්ගෙන් සිදුවන වගා හානි අවම කර ගැනීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම | ගොවිතැන් කටයුතු සිදු කිරීමේ දී වඳුරන්, රිලවුන් සහ මොණරුන් වැනි සතුන්ගෙන් විශාල ලෙස වගා හානි සිදුවන බවත්, අක්කර 05ක සින්නක්කර ඉඩම් හිමියන් සඳහා තුවක්කු බලපත්‍ර ලබා දෙන අතර මේ වන විට එතරම් ඉඩම් ප්‍රමාණ වගාකරුවන්ට නොමැති නිසා බලපත්‍ර ලබා ගැනීමටද අපහසු වී ඇති බවට කරුණු ඉදිරිපත් විය.<br>භූමි ප්‍රමාණය අක්කර 2.5 දක්වා අඩු කිරීමට මේ වන විට යෝජනා ඉදිරිපත් කර ඇති බවට ද කරුණු ඉදිරිපත් විය.<br>රදනිආර හෙක්ටයාර 200ක පමණ ෆයිනස් හා තේක්ක වගාව ව්‍යාප්ත කර අති බැවින් වන සතුන් ආහාර සොයා වගා බිම්වලට ඇතුල් වන බවටත්, එම | ෆයිනස් හා තේක්ක වගාවන් ඉවත් කොට ප්‍රදේශයට ගැලපෙන පළතුරු වර්ග වගා කිරීම සුදුසු බවට තීරණය කරන ලදි. | සහකාර අධ්‍යක්ෂ - වනජීවී / දිසාවන නිලධාරී /සහකාර අධ්‍යක්ෂ - මධ්‍යම පරිසර අධිකාරිය / අදාල සියළුම වගකිවයුතු ආයතන ප්‍රධානීන් |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | තත්ත්වය මගහරවා ගැනීම සඳහා කැලෑ තුළ පළතුරු හා සතුන්ට ආහාර වගාව ආරම්භ කිරීම සුදුසු බවටත් කරුණු ඉදිරිපත් විය. | | |
| **07** | **ජල සම්පාදන ක්ෂේත්‍රයේ ගැටළු** | | | |
| 7.1 | මැදමුලන කිංචිගුනේ ප්‍රජා ජල ව්‍යාපෘතියේ ගැටළු | ජල සම්පාදන මණ්ඩලයෙන් තොග ජලය ලබා ගෙන පාරිභෝගිකයන් සඳහා වැඩි මුදලට ලබා දෙන බවටත්, එම නිසා එම ජල යෝජනා ක්‍රමය ජල සම්පාදන මණ්ඩලයට පවරා ගන්නා ලෙස පාරිභෝගිකයන් ඉල්ලීම් කර ඇති බවටත් කරුණු ඉදිරිපත් විය.<br>අම්බල උතුර ප්‍රජා ජල ව්‍යාපෘතිය හා අම්බල බටහිර සිසිලස ප්‍රජා ජල ව්‍යාපෘතිය ඇතුළුව ප්‍රජා ජල ව්‍යාපෘති 90%ක් පමණ පවත්වාගෙන යාමේ ගැටළු පවතින බැවින් ඒවා ජල සම්පාදන මණ්ඩලයට පවරා ගන්නා ලෙසත්, සේවකයන් කොන්ත්‍රාත් පදනමින් යොදවා ගන්නා ලෙසත් ඉල්ලීම් ඉදිරිපත් විය. | ඒ සඳහා කමිටුවේ එකඟතාවය ලබා දුන් අතර, ප්‍රජා ජල ව්‍යාපෘතියේ එකඟතාවය සහිතව ඉල්ලීමක් ඉදිරිපත් කරන ලෙස දන්වන ලදි.<br>ජලසම්පාදන මණ්ඩලයට පවරා දිය යුතු ව්‍යාපෘති සම්බන්ධ වාර්තාවක් මීළඟ කමිටුවට ඉදිරිපත් කිරීමට තීරණය කරන ලදි. | ප්‍රාදේශීය කළමනාකරු - ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය / ස්ථාන භාර නිලධාරී - ප්‍රජාජල සැපයුම් දෙපාර්තමේන්තුව |
| 7.2 | මිද්දෙනිය නගරයේ පානීය ජල ගැටළුව | මිද්දෙනිය නගරයට ප්‍රමාණවත් පානීය ජලය නොමැති බවට කරුණු ඉදිරිපත් විය.<br>අඟුණකොළපැලැස්ස - මිද්දෙනිය ජල ව්‍යාපෘතියෙන් එම ප්‍රදේශ ආවරණය වන බවත් ව්‍යාපෘතිය මාස තුනක් පමණ ඇතුලත අවසන් කළ හැකි බවත් දන්වන ලදි. | වර්තමාන තත්ත්වය හා අපේක්ෂිත ව්‍යාපෘති පිළබඳ ඉදිරිපත් කිරීමක් මීළඟ කමිටුවේ දී සිදු කරන ලෙස උපදෙස් ලබා දුනි. | ප්‍රාදේශීය කළමනාකරු - ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය |
| **08** | **වෙනත් ගැටළු** | | | |
| 8.1 | හම්බන්තොට හා අනෙකුත් නගර සැළසුම් පිළිබඳව සාකච්ඡා කිරීම | හම්බන්තොට නගරය හා දිස්ත්‍රික්කයේ අනෙකුත් නගරවල සැළසුම් පිළිබඳව සෑම ආයතනයකටම නිවැරදි අවබෝධයක් නොමැති වීම නිසා විවිධ ගැටළු පැන නගින බවට කරුණු ඉදිරිපත් විය. ඒ නිසා සියළු පාර්ශවයන් නගර සැලසුම් පිළිබඳව දැනුවත් විය යුතු බවටත් දේශපාලන අධිකාරිය ද ඊට සම්බන්ධ විය යුතු බවටත් අදහස් ඉදිරිපත් විය. | ප්‍රාදේශීය සභා සභාපතිවරුන් ඇතුළුව මීට අදාල සියළුම ආයතන ප්‍රධානීන් සමඟ වෙනම සාකච්ඡාවක් පවත්වන ලෙස දන්වන ලදි. | නියෝජ්‍ය අධ්‍යක්ෂ - නාගරික සංවර්ධන අධිකාරිය |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 8.2 | අම්බලන්තොට මහජන පොල පොලීසිය ඉදිරිපිට ස්ථාපිත කිරීම. | අම්බලන්තොට මහජන පොල සඳහා පවතින භූමි ප්‍රමාණය ප්‍රමාණවත් නොවන බැවින් අම්බලන්තොට නගර සැලැස්මේ සඳහන් පරිදි පොලීසිය ඉදිරිපිට පිහිටි කෘෂිකර්ම බීජ හා රෝපන ගොවිපොල වෙත රැගෙන යාම සුදුසු බවට යෝජනා කරන ලදි. | ප්‍රාදේශීය සභා සභාපති, ප්‍රාදේශීය ලේකම්, කෘෂිකර්ම අංශයේ නිධාරීන් සහ නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරීන් සමඟ සාකච්ඡා කර නගර සංවර්ධන සැලැස්මට අනුව කටයුතු කරන ලෙස දන්වන ලදි. | ගරු සභාපති - අම්බලන්තොට ප්‍රාදේශීය සභාව / ප්‍රාදේශීය ලේකම් - අම්බලන්තොට / නියෝජ්‍ය අධ්‍යක්ෂ - නාගරික සංවර්ධන අධිකාරිය |
| 8.3 | අඟුණකොළපැලැස්ස කසල අංගනයේ කසල කළමනාකරණ කටයුතු සඳහා ඉදිකිරීම් හා යන්ත්‍ර අවශ්‍යතා සපුරා ගැනීම | ප්‍රදේශයේ කසල පරිසර හිතකාමීව කළමණාකරණය කර ගැනීම සඳහා අවශ්‍ය යන්ත්‍ර සපයා ගැනීම, අංගනය වටා දැල් වැට ඉදිකර ගැනීම ආදී අවශ්‍යතාවයන් සපුරා ගැනීමට ඇති බවත්, සේවක පුරප්පාඩු සපුරා ගත යුතු බවත්, දන්වන ලදි. | එම අවශ්‍යතාවයන් මධ්‍යම පරිසර අධිකාරියෙන් ඉල්ලීම් කර සපයා ගන්නා ලෙසත්, සේවක පුරප්පාඩු රැකියා ලක්ෂයේ වැඩසටහන මඟින් පපුරා දිය හැකි බැවින් ප්‍රාදේශීය මට්ටමින් ඉල්ලීම් ඉදිරිපත් කරන ලෙස උපදෙස් ලබා දුනි. | සියළුම ප්‍රාදෙශීය සභා ගරු සභාපතිවරුන් |
| 8.4 | විදුලි රැහැන්වලට බාධාවන ගස් ඉවත් කිරීමේ දී මතු වී ඇති ගැටළු | විදුලිබල මණ්ඩලය මඟින් පාර දෙපස ගස් අතු කපා ඉවත් කිරීම වෙනම කොන්ත්‍රාත් ආයතනයන් වෙත භාර දී ඇති බැවින් එම ආයතන කපා ඉවත් කරන අතු පාර දෙපස දමා යාම හේතුවෙන් ගැටළු පැන නැගී ඇති බවට තොරතුරු ඉදිරිපත් විය.<br>එම කාර්යයන් ප්‍රාදේශීය සභාව හරහා සිදු කළ හැකි වුව ද, විදුලි බල මණ්ඩලය මඟින් ඉදිරිපත් කරන කොන්දේසි මත එය ප්‍රාදේශීය සභාවට ක්‍රියාත්මක කිරීමේ හැකියාවක් නොමැති බව ප්‍රාදේශීය සභා ගරු සභාපතිවරුන් විසින් දන්වන ලදි. | කපා ඉවත් කරන ගස් අතු ආදිය කොම්පොස්ට් සඳහා ලබාගත හැකි බැවින් විදුලිබල මණ්ඩලය හා ප්‍රාදේශීය සභා එකතු වී සාකච්ඡා කර ගැටළු විසඳා ගන්නා ලෙස උපදෙස් ලබා දුනි.<br>මෙවැනි කටයුතු ප්‍රාදේශීය සභා මඟින් ඉටුකරගැනීමට විදුලිබල මණ්ඩලයේ අවධානය යොමුවිය යුතු බව ද දන්වන ලදි. | සියළුම ප්‍රාදේශීය සභා ගරු සභාපතිවරුන් /ප්‍රධාන විදුලි ඉංජිනේරු - විදුලි බල මණ්ඩලය |
| 8.5 | තංගල්ල නගරයේ ඇති මධ්‍යම පරිසර අධිකාරියේ දිස්ත්‍රික් කාර්යාලය පරිපාලන සංකීර්ණයේ ස්ථාපිත කිරීම | අනෙකුත් කාර්යාල පරිපාලන සංකීර්ණයේ පිහිටා තිබිය දී මෙම කාර්යාලය තංගල්ල ප්‍රදේශයේ පිහිටා තිබීම හේතුවෙන් සේවාලාභීන් අපහසුතාවයට පත් වී ඇති බවත්, පරිපාලන සංකීර්ණයට තවත් ගොඩනැගිලි සංකීර්ණයක් එකතු විය යුතු බවට යෝජනා කරන ලද අතර, නගර සභා ගොඩනැගිල්ලේ ඉඩ ප්‍රස්ථාව ඇති බැවින් එම කාර්යාලය මෙන්ම භූ විද්‍යා පතල් කැනීම් කාර්යාලය ද පරිපාලන සංකීර්ණයේ ස්ථාපිත කිරීමේ අවශ්‍යතාවය පෙන්වා දෙන ලදි. | නගරසභා ගොඩනැගිල්ලේ කොටසක් මධ්‍යම පරිසර අධිකාරියේ දිස්ත්‍රික් කාර්යාලය පිහිටුවීමට පිළිබඳ ප්‍රධාන කාර්යාලය දැනුවත් කර ඉදිරි කටයුතු සිදුකරන ලෙස උපදෙස් ලබා දුනි. | සහකාර අධ්‍යක්ෂ - මධ්‍යම පරිසර අධිකාරිය |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 8.6 | පරිපාලන සංකීර්ණයේ සෝලා යන්ත්‍ර (solar power system) සවි කිරීම | මේ වන විට පරිපාලන සංකීර්ණයේ මාසික විදුලි බිල සඳහා අධික පිරිවැයක් දැරීමට සිදුවන බැවින් solar power system සවි කිරීම සුදුසු බවට යොජනා කරන ලදි. | සුනිත්‍ය බලශක්ති අධිකාරියේ විශේෂ ව්‍යාපෘතිය මඟින් එම කටයුතු කඩිනම් කිරීම සඳහා දැනුවත් කිරීමට උපදෙස් ලබා දුනි. | අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) |
| 8.7 | රජයේ නිලධාරීන්ගේ නිල නිවාස සඳහා අය කිරීම | නාගරික සංවර්ධන අධිකාරිය මඟින් රජයේ නිලධාරීන්ගේ නිවාස සඳහා විශාල මුදලක් අය කරන අතර එය රජයේ නිලධාරීන්ට දරාගැනීමට නොහැකි බැවින් රාජ්‍ය චක්‍රලේඛ අනුව මුදල් අය කිරීමට හෝ නැතිනම් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට එම නිල නිවාස පවරා දීම සුදුසු බවට යෝජනා ඉදිරිපත් විය. | මේ සඳහා කඩිනම් පියවර ගන්නා ලෙස උපදෙස් ලබා දුනි. | නියෝජ්‍ය අධ්‍යක්ෂ - නාගරික සංවර්ධන අධිකාරිය |
| 8.8 | හම්බන්තොට වරාය සංවර්ධන දෙවන අදියර සඳහා පවරාගත් ඉඩම්වල ඇති ගොඩනැගිලි සුන්බුන් ඉවත් කිරීම | මෙම ඉඩම් වරාය සංවර්ධනය සඳහා පවරා ගත්ත ද සංවර්ධනය නොවීම හේතුවෙන් ගැටළු මතු වී ඇති බවටත්, එම ඉඩම්වල ඇති ගොඩනැගිලි සුන් බුන් ඉවත් කිරීම සඳහා වගකීම් දරන ආයතනයක් නොමැති බවටත්, මේ හේතුවෙන් ඇතැම් සමාජ අපචාර ක්‍රියා ද මේ ආශ්‍රිතව වර්ධනය වී ඇති බවටත් කරුණු ඉදිරිපත් විය. | වරාය අධිකාරිය විසින් වන්දි ගෙවා ඇත්නම් එම අයිතිය වරාය අධිකාරියට තිබිය යුතු අතර, එම සුන් බුන් ඉවත් කිරීමට වරාය අධිකාරියට දන්වන ලෙස තීරණය කරන ලදි. | ප්‍රාදේශීය ලේකම් - හම්බන්තොට |
| 8.9 | අයාලයේ යන සුනඛ ගහනය වර්ධනය වීම නිසා මතු වී ඇති ගැටළු | සුනඛයින් වන්ද්‍යාකරණය කිරීම මේ වන විට සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් සිදු කරන බවත්, ඒ සඳහා වෙන් කෙරෙන ප්‍රතිපාදන ප්‍රමාණය සීමිත වන බැවින් ගැහැණු සුනඛයින් අවශ්‍ය ප්‍රමාණයට වන්ද්‍යාකරණය ලක් කිරීමට හැකියාවක් නොමැති බවත්, සුනඛයින් එක් ස්ථානයක ගාල් කරන්නේ නම් එය විධිමත් පරිදි මනා සංවිධානයකින් යුතුව කළ යුත්තක් වන බවත්, එසේ නොමැති වුවහොත් ඒ මඟින් වෙනත් ගැටළු ඇතිවීමේ අවදානමක් ද පවතින බවත් දන්වන ලදි. | සුනඛයින් වන්ද්‍යාකරණය සත්ත්ව නිෂ්පාදන දෙපාර්තමේන්තුවට පැවරීම සුදුසු වන බැවින් ඒ සඳහා වූ යෝජනාව සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත යොමු කරන ලෙස උපදෙස් ලබා දුනි. තව ද, වන්ද්‍යාකරණය සඳහා ලබා දෙන මුදල් වැඩිකිරීමට ඉල්ලීම් කරන ලෙස ද උපදෙස් ලබා දුනි. | දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ |
| 8.10 | මිරිජ්ජවිල උද්භිත උද්‍යානයට පිවිසීම සඳහා ප්‍රවාහන පහසුකම් නොමැති වීම | මෙම උද්‍යානය දිස්ත්‍රික්කයේ සංචාරක කර්මාන්තය වැඩි දියුණු කිරීම සඳහා ද මහඟු තොතැන්නක් වන බැවින් ඒ සඳහා පහසුවෙන් ලඟා වීමට පොදු ප්‍රවාහන සේවාවක් නොමැති වීම විශාල අඩුපාඩුවක් වන බව දන්වන ලදි.<br>සූරියවැව දක්වා බලපත්‍ර ලබා දීමේ ගැටළු පවතින බවට ද කරුණු ඉදිරිපත් විය. | අම්බලන්තොට නගරයෙන් ආරම්භ කර උද්භිත උද්‍යානය ආවරණය වන පරිදි බැල්ලගස්වැව දක්වා ගමන් ගන්නා ලං.ග.ම. බස් රථයක් ධාවනය කිරීම සුදුසු බවටත්, විශේෂයෙන්ම නිවාඩු දිනවල එය යෙදවීම සුදුසු බවටත් තීරණය කරන ලදි. | සහකාර අධ්‍යක්ෂ - දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය / ඩිපෝ අධිකාරී - අම්බලන්තොට |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 8.11 | පඩව්ගම නිවාස ව්‍යාපෘතියේ නිවාස සඳහා අලි වැටක් ඉදිකිරීම | වන අලි තර්ජනය හේතුවෙන් පදිංචිකරුවන්ගේ ආරක්ෂාව සඳහා අලිවැටක් ඉදිකිරීමට අවශ්‍ය බවට කරුණු ඉදිරිපත් විය. රක්ෂිත සීමාවන්වල මෙවැනි නිවාස ව්‍යාපෘති සඳහා අවස්ථාව ලබා දීම ගැටළු සහගත බවට කරුණු ඉදිරිපත් විය. | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් එම ව්‍යාපෘතිය සඳහා ඉඩම් නිදහස් කිරීම සම්බන්ධයෙන් වාර්තාවක් ලබා දෙන ලෙස උපදෙස් ලබා දුනි. | සහකාර අධ්‍යක්ෂ (වනජීවී) / දිසාවන නිලධාරී/ නිවාස සංවර්ධන අධිකාරිය |
| 8.12 | තංගල්ල මූලික රෝහලට ගිලන් රථ ලබා ගැනීම | තංගල්ල මූලික රෝහල මධ්‍යම රජයට පැවරීම සඳහා අවශ්‍ය මූලික කටයුතු සිදුකර ඇති බව දන්වන ලද අතර, මේ වන විට රෝහලේ ප්‍රමාණවත් ගිලන්රථ නොමැති බැවින් ගැටළු මතු වී ඇති බවට ද කරුණු ඉදිරිපත් විය. | රෝහල මධ්‍යම රජයට පැවරීමේ කටයුතු කඩිනම් කරන ලෙස උපදෙස් ලබා දුන් අතර, ගිලන්රථ ලබාගැනීම සඳහා දකුණු පළාත් සභාවේ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන බැවින් සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ඒ සඳහා ඉල්ලීම් කරන ලෙස උපදෙස් ලබා දුනි. | ලේකම් - දකුණු පලාත් සෞඛ්‍ය අමාත්‍යාංශය / දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ / රෝහල් අධිකාරී - තංගල්ල |
| 8.13 | ලුණුගම්වෙහෙර බෙරලිහෙල පොළ ගිලා බැසීම හේතුවෙන් මතු වී ඇති ගැටළු | ලුණුගම්වෙහෙර බෙරලිහෙල පොල ගිලා බැසීම නිසා අවධානම් තත්වයක් පවතින බවට කරුණු ඉදිරිපත් විය. | ඒ පිළිබඳව සොයා බලා කඩිනමින් ගැටළු විසදීමට අවශ්‍ය කටයුතු කරන ලෙස උපදෙස් ලබා දුනි. | ගරු සභාපති - ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාව |
| 8.14 | ලුණුගම්වෙහෙර දෙව්රම්වෙහෙර ජල පෙරණය සඳහා වැලි ලබා ගැනීම | ලුණුගම්වෙහෙර දෙව්රම්වෙහෙර හා බෝගහවැව වසම් සඳහා ජලය ලබා දෙන ජල ටැංකිවල පෙරහන් පද්ධතියට අවශ්‍ය වැලි ලබා ගැනීමේ ගැටළුවක් පවතින බවට කරුණු ඉදිරිපත් වූ අතර, දෙගල්දෙහිර තොටුපලින් අවශ්‍ය වැලි ලබා ගැනීමට අවස්ථාව ලබා දෙන ලෙස ඉල්ලීම් ඉදිරිපත් විය. | මේ පිළිබඳව පරීක්ෂා කර බලා අවශ්‍ය කටයුතු සිදුකරන ලෙස උපදෙස් ලබා දුනි. | සහකාර අධ්‍යක්ෂ (වනජීවී) / ප්‍රාදේශීය ලේකම් - හම්බන්තොට |

ඉහත කරුණු සාකච්ඡා කිරීමෙන් අනතුරුව, ඉදිරි සම්බන්ධීකරණ කමිටු රැස්වීම්වලදී පහත සඳහන් කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් කටයුතු කළ යුතු බවට වාරිමාර්ග ගරු අමාත්‍ය චමල් රාජපක්ෂ මැතිතුමන් විසින් සභාවේ අදහස් දක්වමින් ප්‍රකාශ කරන ලදි.

- දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ දී දිස්ත්‍රික්කයේ සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය සාකච්ඡා කිරීම සිදු විය යුතු බව,
- ප්‍රාදේශීය ගැටළු සම්බන්ධයෙන් අදාල ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවලදී දී සාකච්ඡා කර විසඳාගන්නා ලෙසත්, එසේ නොහැකි ගැටළු පමණක් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව වෙත යොමු කළ යුතු බව
- අදාල නොවන පුද්ගලයින් කමිටුවට සහභාගී වීම වළක්වා ගැනීමට කටයුතු කළ යුතු වන බව,
- නියමිත නිලධාරීන් මෙම රැස්වීමට පැමිණිය යුතු බැවින් , කිසියම් අත්‍යාවශය හේතුවකින් පැමිණීමට නොහැකි වූ විට එම නිලධාරියා නියෝජනය කරමින් සහභාගීවන නිලධාරියාට අදාල ආයතනය

සම්බන්ධයෙන් තීරණයක් ගැනීමේ බලය තිබිය යුතු බැවින් ඒ සඳහා සුදුසු නිලධාරියෙකු සහභාගී විය යුතු බව,

- සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී අදාල ප්‍රාදේශීය මට්ටමේ මහජන නියෝජිතයන් දැනුවත් කිරීම වැදගත් වන බව,
- යෝජනා ක්‍රියාත්මක කිරීමේ දී අදාල රේඛීය අමාත්‍යාංශයෙන් අනුමැතිය ලබාගත යුතු බව,
- දිස්ත්‍රික්කයේ පවතින ගැටළු හා ව්‍යාපෘති සම්බන්ධ අදහස් හා අඩුපාඩු මහජන නියෝජිතයන් හා රාජ්‍ය නිලධාරීන් සම්බන්ධීකරණය වී සාකච්ඡා කළ යුතු අතර, එහිදී එක් එක් පාර්ශවයන්ට චෝදනා එල්ල කිරීමෙන් වැලකී සිටිය යුතු බව හා සම්බන්ධීකරණ කමිටු පැවැත්වීම සම්බන්ධයෙන් ස්වදේශ කටයුතු අමාත්‍යාංශය මඟින් නිකුත් කර ඇති 4/2019 හා 4/2019 (I) චක්‍රලේඛ පිළිබඳව සියළු දෙනා නිසි අවබෝධයෙන් කටයුතු කළ යුතු බව,

සෑම මසකම හතරවන සතියේ සඳුදා දින මෙම රැස්වීම පැවැත්වීමට තීරණය විය. ඒ අනුව, ඉදිරි රැස්වීම් දිනය 2020.10.26 වන බැවින් මෙම රැස්වීමේ දී සාකච්ඡා වූ එක් එක් කරුණු සම්බන්ධයෙන් වගකීම් පැවරී ඇති සියළුම දෙනා ඊට අදාල කටයුතු ඉටු කර එහි ප්‍රගතිය කඩිනමින් වාර්තා කළ යුතු බව දන්වන ලද අතර, රාජ්‍ය නිලධාරීන් මෙන්ම මහජන නියෝජිතයන් ද මහජන බදු මුදලින් නඩත්තු වන බැවින් සියළුම දෙනා දිස්ත්‍රික්කයේ ඉදිරි දියුණුව උදෙසා සහයෝගීව කටයුතු කිරීමේ වැදගත්කම ද සිහිපත් කරමින් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම සාර්ථකව පැවැත්වීම සම්බන්ධයෙන් කමිටුවේ සියළුම සාමාජිකයන් වෙත කමිටුවේ සම සභාපති වෛද්‍ය උපුල් සංජීව ගලප්පත්ති මැතිතුමන් විසින් ස්තූති කළ අතර, ප.ව 2.30ට පමණ රැස්වීමේ කටයුතු අවසන් විය.

**ඩබ්ලිව්.එච්. කරුණාරත්න**
**දිස්ත්‍රික් ලේකම්/ දිසාපති**
**හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කය**

2020 සැප්තැම්බර් මස ....14........ දින
හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී ය.